**ජාතික රක්ෂණ භාර අරමුදල - 2014**

**--------------------------------------**

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ13(1) වගන්තිය සහ 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 17 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අරමුදලේ සභාපති වෙත 2016 ජනවාරි 04 වන දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 අනුව අස්ථිත්වය විසින් ද්‍රවශීලතාවය පදනම් කරගෙන ජංගම හා ජංගම නොවන වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනම වර්ගීකරණයක් ලෙස ඉදිරිපත් කළ යුතු වුවද අරමුදල විසින් එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 04 ට අනුව රක්ෂණ හිමිකම්පෑම් වියදම් හඳුනා ගැනීමේදී පසුගිය අත්දැකීම් හා උපනතීන් අනුව හැකිතාක් යථාර්ථ නිරූපණය වන බව තහවුරු වනු පිණිස ප්‍රතිපාදන වෙන් කිරීම් සිදු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී රු. 24,096,208 ක අධි ප්‍රතිපාදනයක් සිදු කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශුද්ධ අගය රු. 9,501,597 ක් වූ මෝටර් රථ 4 ක වෙළඳපල වටිනාකම රු.15,400,000 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර තිබුණද, එම අගය පෙන්නුම් කරන පරිදි ගිණුම් ගත කිරීමට කටයුතු නොකර ඵලදායී ආයු කාලය නැවත ඇස්තමේන්තු කිරීමක් පමණක් සිදුකර තිබුණි.

(ආ) කුලී වියදම හා සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ අරමුදලේ දායකත්වය මුදල් පදනම මත ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ කුලී වියදම හා සේවක අර්ථසාධක අරමුදල් වියදම පිළිවෙලින් රු.1,500,000 කින් හා රු.546,183 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සේවක පාරිතෝෂික ගණනය කිරීමේ වූ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදනයෙහි රු. 189,946 ක අධි වෙන් කිරීමක් නිරීක්ෂණය විය.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අරමුදලේ සාමාන්‍ය, ප්‍රතිරක්ෂණය හා වෙනත් අංශවලට අදාලව ලැබිය යුතු වාරික ආදායම වූ රු. 718,919,253 ක් සඳහා ශේෂ සනාථන ලිපි හා රු.68,675,128 ක් වූ අනෙකුත් මූල්‍ය වගකීම්වලට අදාල විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් නොවීය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල විසින් ක්‍රියාත්මක කරමින් පැවති වගා රක්ෂණය 2014 මහ කන්නයේ සිට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පවරා තිබීම නිසා එම මණ්ඩලය වෙත ගෙවිය යුතු වූ රු.50,000,000 ක ඇස්තමේන්තුගත වාරික මුදලින් 2015 දෙසැම්බර් 31 දින වනවිටත් රු.11,904,463 ක් මණ්ඩලය වෙත ගෙවිය යුතුව පැවතුණි.

(ආ) අරමුදල යටතේ වූ වැඩවර්ජන, කැරලිකෝලාහල, සිවිල් අරගල සඳහා වූ අරමුදලට රක්ෂණ සමාගම් විසින් ගෙවනු ලබන වාරික මුදල් විවිධ හේතුන් මත ආපසු ඉල්ලා සිටින අවස්ථාවලදී ආපසු ගෙවීම සඳහා පත් කළ කමිටුවේ අනුමැතිය ලැබී තිබුණු රු.11,928,811 ක් නිරවුල් කිරීමට අවශ්‍ය විවිධ ලිපි ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා තවදුරටත් නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) වර්ෂ 1 සිට වර්ෂ 4 ට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවති රු.757,980 ක් වූ අගරු චෙක්පත් වෙනුවෙන් ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට 2015 දෙසැම්බර් 31 දිනවන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂ තුනක් තිස්සේ ඉදිරියට ගෙන එමින් පැවති අග්‍රහාර අංශයට අදාල ලැබිය යුතු රු.859,655 ක් අදාල පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත | |
| | (i) 7 (1) වගන්තිය | සෑම රක්ෂණකරුවෙකුගේම වාර්ෂික ශුද්ධ වාරික ආදායම මත කලින් කල ගැසට් පත්‍රයෙහි පල කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලබන අනුප්‍රමාණ ඇතිව සෙස් බද්දක් අරමුදල විසින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට ගෙවිය යුතු වුවද, 2011 හා 2012 වර්ෂවලට අදාලව රු.56,829,739 ක් ගෙවිය යුතුව පැවති අතර 2013 හා 2014 වර්ෂ වෙනුවෙන් කිසිදු මුදලක් වෙන් කර හෝ ගෙවා නොතිබුණි. |
| | (ii) 16(1) වගන්තිය | නියම කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක්, සෑම රක්ෂණකරුවෙක් විසින්ම වාර්ෂික ගාස්තුවක් වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට ගෙවිය යුතු වුවද, මණ්ඩලයේ වාර්තා අනුව 2011 සිට 2014 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව අරමුදල විසින් රු.10,349,888 ක් මණ්ඩලයට ගෙවිය යුතුව පැවතුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 පරිච්ඡේදය | මානව සම්පත් කළමනාකරණයට අදාල රීති හා රෙගුලාසි ඇතුලත් පරිපාලන අත්පොතක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය ලබාගත |

යුතු වුවද, ආයතනයේ ක්‍රියාත්මක කරනු ලබන කාර්ය පරිපාටි සංග්‍රහය සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,582,655,586 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,239,427,182 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.343,228,404 ක වර්ධනයක් විය. ශුද්ධ ප්‍රතිලාභ හා හිමිකම් ගෙවීම් සහ අත්පත් කර ගැනීමේ වියදම් පිළිවෙලින් රු. 1,823,900,049 කින් හා රු.312,593,232 කින් වැඩි වුවද, දළ වාරික ආදායම, වගා රක්ෂණ ආදායම හා අග්‍රහාර සඳහා ලද දායකත්වය පිළිවෙලින් රු.1,674,034,223 කින්, රු.743,810,655 කින් හා රු.88,193,134 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව, සමාජයේ වඩා වැඩි අවදානම්වලට ලක්වන පාර්ශව වෙනුවෙන් රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ වූ අතර, ඒ සඳහා සැලසුම් සකස් කර තිබුණු නමුත් රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට අරමුදල විගණිත දිනය දක්වා ක්‍රියාකර නොතිබුණි.

(ආ) 2009 සැප්තැම්බර් 18 දිනැති අංක PF/ 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සියළුම රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන තම අවශ්‍යතාවයන් අනුව මෝටර් රථ රක්ෂණය ජාතික රක්ෂණ භාර අරමුදල හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් පමණක් සලසා ගත යුතු බව දන්වා තිබුණි. කෙසේ වුවද, 2013 වර්ෂයේ රාජ්‍ය අංශ රථවාහන 9158 ක් රක්ෂණය කර තිබුණ නමුත් 2014 වර්ෂයේදී එය 6206 ක් දක්වා එනම් සියයට 32 කින් පහල ගොස් තිබුණි. මේ හේතුවෙන් රක්ෂණ ආදායමද රු. මිලියන 39 කින් අඩු වී තිබුණි. එසේම, 2013 වර්ෂයේදී පෞද්ගලික වාහන 22 ක් රක්ෂණය කර තිබුණද, 2014 දී එක් වාහනයක් හෝ රක්ෂණය කර නොතිබූ නිසා අරමුදල විසින් වාහන රක්ෂණ සම්බන්ධව කිසිදු ප්‍රගතියක් අත්පත් කරගෙන නොතිබුණි.

(ඇ) 2013 අගෝස්තු 23 දිනැති අංක 1824/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව බැංකු, මූල්‍ය සමාගම් හා රක්ෂණ සමාගම්වලින් අය කරනු ලබන වගා අය බදු (Crop Levy) ආදායම් රැස් කිරීම අරමුදල වෙත පවරා තිබුණු අතර, එම මුදල් භාවිතය සම්බන්ධයෙන් මෙතෙක් උපදෙස් අරමුදල වෙත ලැබී නොතිබුණි. එසේ වුවද, ප්‍රමාණවත් මුදලක් ශේෂයේ නොමැතිවීම නිසා ගෙවීමට නොහැකි වූ වගා රක්ෂණ වන්දි ඉල්ලීම් මෙම බදු මුදලින් ගෙවීමට අරමුදල කටයුතු කර තිබුණි. 2013 හා 2014 වර්ෂවලදී වගා බදු අයකිරීමෙන් අරමුදලට ලැබී තිබුණු ආදායම පිළිවෙලින් රු.මිලියන 440.8 ක් හා රු.මිලියන 1,184.6 ක් විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

මෝටර් රථ, මෝටර් රථ නොවන හා අනෙකුත් විවිධ රක්ෂණයන් යටතේ රක්ෂණ ක්‍රියාත්මක කිරීම/ ප්‍රතිරක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා අරමුදල 2014 දෙසැම්බර් 31 දක්වාම මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර නොමැති බැවින් අනෙකුත් රක්ෂණ ආයතන කටයුතු කරන ආකාරය අනුව එම රක්ෂණ කටයුතු කරනු ලබන බව විගණනයේදී නිරීක්ෂණය විය. මේ නිසා ශ්‍රී ලංකාව තුල ප්‍රතිරක්ෂක ලෙස කටයුතු කරනු ලබන මෙම අරමුදල විසින් තම ව්‍යාපාර කටයුතු ආරම්භ කර සැලකිය යුතු කාලයක් ගත වී තිබියදීත් රක්ෂණ කටයුතු සඳහා අනුමත ක්‍රමවේදයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

2005 අයවැය යෝජනා මගින් රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට සමාන හා වැඩි ප්‍රතිලාභ හිමිකරදීමේ අරමුණින් හඳුන්වා දී තිබූ අග්‍රහාර රක්ෂණ ක්‍රමයට නිලධාරීන්ගේ වැටුපෙන් අයකරනු ලබන අග්‍රහාර දායක මුදල් නියමිත පරිදි අරමුදල වෙත ලැබුනේ ද යන්න හා ප්‍රතිලාභ ගෙවීම් පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා සියලු රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් පිළිබඳ දත්ත පද්ධතියක් හෝ විධිමත් ක්‍රමවේදයක් පවත්වා ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි.

අග්‍රහාර ප්‍රතිලාභ ගෙවීම් සඳහා එක් නිලධාරියෙකු වෙනුවෙන් රජය මාසිකව රු.69 ක දායක මුදලක් අරමුදලට ගෙවනු ලබන බව 2005 මැයි 18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (ii) හි දැක්වේ.එහෙත් අරමුදල විසින් සාමාජික සංඛ්‍යාව නිශ්චිතව හඳුනා ගෙන නොතිබූ බැවින් රජයේ දායකත්වය භාණ්ඩාගාරය විසින් අරමුදල වෙත ලබා දීමේදී සේවක සංඛ්‍යාව පිළිබඳ සැලකිල්ලක් නොදක්වා එකඟ වූ මුදලක් පමණක් ලබා දී තිබීම හේතුවෙන් 2012, 2013 හා 2014 වර්ෂවල අරමුදලට ලැබිය යුතු රජයේ දායකත්වය නිසි පරිදි ලැබී ඇති බවට විගණනයේදී තහවුරු කරගත නොහැකිවිය.

**4.4 හඳුනා ගන්නා ලද පාඩු**

අරමුදල විසින් ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2011 වර්ෂයේ සිට රජයේ සේවකයින් සඳහා අග්‍රහාර යෝජනා ක්‍රමය යටතේ තැන්පතු මුදල් ගෙවීමකින් තොරව රෝහල් ගතවීමේ පහසුකම් සලසාදීමේ අරමුණින් චුම්භක කාඩ්පත් (E card ) ක්‍රමයක් හඳුන්වාදීමට කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 ඡේදයේ (අ) හා (ඈ) ප්‍රකාර පිළියෙල කළ යුතු සියලුම ආශ්‍රිත වියදම් ඇතුළත් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අරමුදල විසින් සකස් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම ද අදාල උපදෙස් ප්‍රකාරව සිදු කර නොතිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය සඳහා සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් මිල ගණන් ලැබී තිබුණද, දෙවන අවම මිල වූ රු.21,820,000 ක් ඉදිරිපත් කර තිබූ පෞද්ගලික ආයතනයකට අදාල කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණු අතර පළමු අවම මිල ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව පිළිගත හැකි හේතු කිසිවක් නිර්දේශවල ඇතුලත් කර නොතිබුණි. කෙසේ වුවද විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබූ මුළු මුදල රු.10,999,000 ක් විය.

(ඇ) අරමුදල විසින් චුම්භක කාඩ්පත් 650,000 ක් සහ එම චුම්භක කාඩ්පත් කියවන යන්ත්‍ර 20 ක් මිලදී ගැනීම සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.4,364,000 ක් හා 2011, 2012 වර්ෂ වල අවස්ථා තුනකදී කාඩ්පත් 250,000 ක් සඳහා කොටස් ගෙවීම් ලෙස එකතුව රු.6,025,000 ක ගෙවීම් ද සිදු කර තිබුණි. කෙසේ වුවද, විගණනයට ලද තොරතුරු අනුව

අරමුදලට ලැබී තිබූ කාඩ්පත් ප්‍රමාණය 221,630 ක් පමණක් වූ බැවින් කාඩ්පත් 28,370 ක් වෙනුවෙන් රු.855,210 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) අරමුදල විසින් අග්‍රහාර ප්‍රතිලාභීන් සම්බන්ධ සම්පූර්ණ දත්ත පද්ධතිය සකස් කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණු අතර 2015 සැප්තැම්බර් 14 දින වන විට සාමාජිකයින් 477,000 ක ගේ දත්ත පරිගණක ගත කර ඇති බවත් මේ වන විට කාඩ්පත් 212,969 ක් නිලධාරින් වෙත ලබා දී ඇති බවත් විගණනයට දන්වා තිබුණි. කෙසේ වුවද, මේ වන විට සැපයුම්කරු කාඩ්පත් මුද්‍රණ කටයුතු නවතා ඇති බැවින් ප්‍රතිලාභීන් වෙත කාඩ්පත් නිකුත් කළ නොහැකි තත්ත්වයක් ඇති වී ඇති බවත් විගණනයට දන්වා තිබුණි.

(ඉ) මෙම කාඩ්පත් කියවන යන්ත්‍ර ප්‍රධාන රෝහල් 9 ක සවි කිරීමට සැලසුම් කර තිබුණද, මේ වනවිට කළමනාකාරීත්වය වෙනස්වීම මත එයද ඉටු කිරීමට නොහැකි වී ඇතිබව ද විගණනයට දන්වා තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩු 20 ක් පැවති අතර ඉන් තනතුරු 06 ක් සඳහා බඳවා ගැනීමට දැන්වීම් පළ කිරීම වෙනුවෙන් රු.515,255 ක වියදමක් දරා තිබුණි . අභ්‍යන්තර විගණක තනතුර සඳහා අයදුම්පත් 09 ක් හා සහකාර සාමාන්‍යාධිකාරි (මුදල් හා සංස්ථාපිත සේවා) තනතුර සඳහා අයදුම්පත් 12 ක් ලැබී තිබුණ ද විගණිත දිනය වන විටත් එම බඳවා ගැනීම් සිදු කර නොතිබුණි. තවද, සහකාර සාමාන්‍යාධිකාරි (රක්ෂණ) තනතුර වෙනුවෙන් 2014 වර්ෂයේදී බඳවා ගැනීම් සිදුකලද 2015 අප්‍රේල් 30 දින වනවිට එම තනතුර නැවත පුරප්පාඩු වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදයට අනුව, මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2015 ඔක්තෝබර් 23 දිනදීය.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 29 සිට සියයට 1176 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

**5.3 නොවිසඳී ඇති විගණන ඡේද**

කොළඹ කොටුව ආශ්‍රිතව 1996 හා 1997 වර්ෂ වල සිදු වූ ත්‍රස්තවාදී බෝම්බ පිපිරීම්වලින් හානියට පත් වාණිජ ආයතන නැවත නඟා සිටුවීම සඳහා අරමුදල යටතේ වූ වැඩවර්ජන, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලින් සියයට 2 ක සහන පොලී අනුපාතයක් යටතේ රු. මිලියන 1,500 ක් ලබා දීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණ ද, ආයතන 07 ක් වෙත අවස්ථා 19 කදී රු. මිලියන 1,789. 48 ක් ලබා දී තිබීම හේතුවෙන් අනුමත සීමාව ඉක්මවා රු.මිලියන 289. 48 ක් ණය මුදල් ලෙස ලබා දී තිබුණි. මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ණය මුදලින් 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල රු.මිලියන 188.2 ක් වූ අතර පෞද්ගලික සමාගමක් වෙත ලබා දී තිබූ ණය මුදලට අදාල රු.11,669,029 ක් ඇතුළුව අවස්ථා 5 කදී එම සමාගමට ලබා දී තිබූ ණය මුදලට අදාල රු. 79,261,218 ක් වූ පොලිය

කපා හැරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු නොකොට අදාල සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය හා මුදල් අමාත්‍යාංශයේ නිළධාරීන් සමඟ පැවති සාකච්ඡාවක එකඟතාවය මත කපා හැර තිබුණි.

(ii) සහන කොන්දේසි යටතේ තවත් පෞද්ගලික සමාගමක් වෙත ලබා දී තිබු ණය මුදලින් 2013 අගෝස්තු 31 දින වන විට ගෙවීමට ඇති රු. මිලියන 111.53 ක් වූ මුල් මුදලත් එම දින වන විට හිඟව තිබූ රු. මිලියන 10.81 ක් වූ පොලී මුදලෙන් සියයට 50 කුත්, 2013 අගෝස්තු 31 හෝ ඊට පෙර එකවර ගෙවීම් කරන්නේ නම් ඉතිරි හිඟ පොලී මුදලත් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ද අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වියදම් පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) පාරිතෝෂික වෙන්කිරීම
(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු තැන්පත්